# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2016

### 2022 නොවැම්බර් - 2023 ජනවාරි

### සමාජීය විද්‍යා පීඨය

### ආර්ථික විද්‍යාව (නව/පැරණි නිර්දේශය)

### සාර්ව ආර්ථික විද්‍යාව ECON – E 3015

කැමති ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. ආර්ථ ක්‍රමයක සාර්ව ආර්ථික සමතුලිතය උදෙසා මූලික සාර්ව ආර්ථික අරමුණු මොනවාදැයි විස්තර කොට එහි දී ඇතැම් සාර්ව ආර්ථික අරමුණු අතර මතුවිය හැකි ගැටුම් මොනවාදැයි පැහැදිලි කරන්න.

02. ආයෝජනය පිළිබඳ නව සම්භාව්‍ය න්‍යාය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

03. 'සම්භාව්‍ය ආර්ථික න්‍යාය අසමත්වීම නිසා ලෝක ආර්ථික අවපාතය ඇතිවිය.' විවේචනාත්මකව කරුණු දක්වන්න.

04. සාර්ව ආර්ථික විචලායයන්ගේ හැසිරීම සහ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ මූල්‍යවාදීන්ගේ නිගමන සහ කේනිසියානුවාදීන්ගේ නිගමන සංසන්දනය කරන්න.

05. උද්ධමනය සහ සේවා වියුක්තිය අතර ප්‍රතිලෝම සම්බන්ධයක් පවතීය යන කේන්සියානු නිගමනය පිලිප්ස් වක්‍ර විග්‍රහය ඇසුරින් සනාථ වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

06. IS-LM විශ්ලේෂණය සේවා වියුක්තිය අඩු කිරීමට සහ ආර්ථිකය ප්‍රසාරණය කිරීමට ප්‍රායෝගිකව භාවිත කරන්නේ කෙසේද යන්න විමසන්න.

07. ජාතික ආර්ථික සංවර්ධනයේ දී ජාත්‍යන්තර වෙළෙඳාම වාසිදායක වන්නේ කෙසේදැයි පැහැදිලි කොට එවැනි සංදර්භයක් තුළ රටකට මුහුණ පෑමට සිදුවන ප්‍රධාන දුෂ්කරතා සහ ගැටලු පිළිබඳ අදහස් දක්වන්න.

08. අ) රාජ්‍ය ණය සහ අය-වැය හිඟය අතර පවත්නා සම්බන්ධතාව පිළිබඳ සාකච්ඡා කරන්න. (ලකුණු 10)

ආ) ඇතැම් රටවල රාජ්‍ය ණය ශීඝ්‍රයෙන් වර්ධනය වන්නේ මන්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

09. ශ්‍රී ලංකා ආර්ථිකය වර්තමානයේ මුහුණ පා ඇති විදේශ විනිමය අර්බුදයට හේතු පහදා එය විසඳා ගැනීම සඳහා ඔබට යෝජනා කළහැකි ප්‍රතිපත්ති නිර්දේශ කවරේද?

10. පහත ඒවාට කෙටි සටහන් ලියන්න (ලකුණු 05 බැගින්)

i. තුලන අය-වැය ගුණකය
ii. ප්‍රාග්ධනයේ ආන්තික කාර්යක්ෂමතාව
iii. ජාතික ආදායම් චක්‍රීය ප්‍රවාහය
iv. සමපේක්ෂණ චේතනාවෙන් මුදලට ඇති ඉල්ලුම

*************************************